# සුන්දර රටක්

# ලස්සන ජීවිතයක්

ඔබත් අපත් ඉපදුනු අපේ මව්බිමත් මේ රටේ ජනතාවත් වර්තමානයේ පත්ව ඇති කණගාටුදායක ඉරණමට පත්විය යුතු නැතැයි අපි සිතමු.

අපේ රට ඉන්දියානු සාගරයේ වෙළඳ හා නාවුක මධ්‍යස්ථානයක පිහිටා ඇති මනරම් දිවයිනකි. අප ලෝකයෙන් සිඟා කෑ යුතු රටක් නොවේ. අපේ රට සතුව ස්වභාවික සම්පත් රැසක් තිබේ. රට වටකර ඇති මහා සාගරය සම්පත් ආකරයකි. අප සතුව ඛනිජ සම්පත් රැසක් තිබේ. අපේ මිනිරන්, පුල්මුඩේ ඛනිජ වැලි නිධිය හා එප්පාවල පෝස්පේට් නිධිය ඉතා වටිනා සම්පත්ය.

කෘෂිකර්මාන්තය දෙස බැලුවත් අපේ රට ඊට උචිත පසක් පොළොවක් ඇති රටකි. අපට අතීතයෙන් උරුම වූ මහා වාරි පද්ධතියක් තිබේ. දක්ෂ උගත් හැකියාවන් ඇති මානව සම්පතක්ද අප සතුය.

අප ඉපැරණි ශිෂ්ටාචාරයකට උරුමකම් කියන දිගු ඉතිහාසයක් ඇති රටකි. අපේ රටේ අතීතයේ මහා වැව් ඇතුළු විශ්මිත ඉදිකිරීම් කළේ කිසිවෙකුටත් අත නොපාය. මෙසේ තිබියෙදීත් අපේ රට දිළිඳුකමට ඇද වැටී ඇත්නම් එහි වරද තිබෙන්නේ රටේ හෝ ජනතාව තුළ නොවේ.

ඉදින් මේ සුන්දර රට, දියුණු රටක් ලෙස ගොඩනැගිය යුතු නොවේද? මේ රටේ ජනයා සතුටින් සිනහවෙන් සමගියෙන් ජීවත් වනු දැකීම අප සැමගේ ප්‍රාර්ථනාව නොවේද? අනාගත පරපුර වෙනුවෙන් සුන්දර රටක් - ලස්සන ජීවිතයක් නිර්මාණය කරමු. ඒ සඳහා පවතින අර්බුදය වටහා ගෙන අලුත් මඟකට එකතු වෙමු.

**මේ ආරාධනය ඒ සඳහාය.**

**ජනතා විමුක්ති පෙරමුණ**

අපේ රටත් අපේ රටේ ජනතාවත් මේ වනවිට ඉතාමත් විශාල විනාශකාරී අර්බුද රැසකට මුහුණ දී සිටී. රටේ ආර්ථිකය බිඳවැටී, ණය බරින් මිරිකී රට හිඟමනට ඇද වැටී තිබේ.

**රටේ ජනතාව එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමට නොහැකිව පීඩාවටත්, වේදනාවටත් පත්ව සිටියි. ජීවිතය පිළිබඳ, අනාගතය පිළිබඳ සියලු බලාපොරොත්තු බිඳවැටී ඇත. අපි සියලු දෙනා මෙය අත්විඳිමින් සිටිමු.**

**මෙවැනි ඛේදනීය තත්වයකට අපේ රට පත්වූයේ ඇයි? අප දැන් සිතා බැලිය යුතු කාරණය එයයි.**

# වරද කාගේද?

ගෙවුණු වසර 73ක් පුරා මෙරට ඡන්දදායක ජනතාවගෙන් සාතිශය බහුතරය ආණ්ඩු පිහිටුවීමට ඡන්දය දුන්නේ, ඒ වෙනුවෙන් වෙහෙස වූයේ අවංක, යහපත් පොදු අරමුණකිනි. එනම් රට හැදීමේ අරමුණෙනි. එහෙත් ඡන්දදායකයින්ගේ එම යහපත් බලාපොරොත්තු බිඳදමා, දුන් පොරොන්දු කඩකොට මෙරට විනාශය කරා රැගෙන විත් තිබෙන්නේ මෙතෙක් කල් බලයට පත්වූ දේශපාලන කණ්ඩායම්ය.

පසුගිය ජනාධිපතිවරණයේදී හා මහ මැතිවරණයේදී සිදුවූයේද මේ දෙයමය. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාලනය පිළිබඳව ජනතාව තැබූ බලාපොරොත්තු සියල්ල ඔවුන් විසින්ම බිඳදමා රටත් ජනතාවත් විනාශයකට ඇද දමනු ලැබ තිබේ. වත්මන් පාලනය විසින් අපේක්ෂාභංගත්වයට පත්කොට අපහසුතාවයට පත්කර තිබෙන්නේ ඔවුන් ගැන විශ්වාසය තැබූ ජන කණ්ඩායම්ය. තමන්ගේ පෞද්ගලික මුදල් වියදම් කර ගෝඨාභය රාජපක්ෂ මහතා දිනවීමට ලංකාවට ආ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ද විනයගරුක ලස්සන රටක් අපේක්ෂා කළ තරුණ කණ්ඩායම්ද ජාතික ආරක්ෂාව ගැන, දේශප්‍රේමීත්වය ගැන සිතූ සියලු දෙනාද හොඳ රටක් ගැන සිහින මැවූ වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, පරිසරවේදීන් හා සමස්ත පොදු ජනතාවද රාජපක්ෂ පාලනය විසින් පාවාදෙනු ලැබ තිබේ.

**එබැවින් මේ විනාශයට වගකිව යුත්තේ අවංක අරමුණකින් ඡන්දය දුන් ජනතාව නොව කූට අරමුණු සහිතව ජනතාව රවටා බලය ලබාගත් පාලක කණ්ඩායම්ය.**

මෙතෙක් පැවති වංචාකාරී, ප්‍රෝඩාකාරී වැරදි දේශපාලනයේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ කුමක්ද? රටත් ජනතාවත් දුප්පත් වී පාලකයින් හා ඔවුන් වටා සිටින දූෂිත වළල්ලක් පමණක් පොහොසත් වීම නොවේද?

දැන් අප අලුත් දේශපාලන ගමනක් පිළිබඳ සිතිය යුත්තේ, නව දේශපාලන මඟක් තෝරාගත යුත්තේ මේ නිසාය.

# මඳක් සිතන්න...

## කඩවුණු පොරොන්දු

ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ වත්මන් පාලනය බලයට පත්වූයේ ජනතාවට පොරොන්දු රැසක්ද බලාපොරොත්තු රැසක්ද ඇති කරමිනි. එදා ඔවුන් කීවේ මොනවාද?

- **සෞභාග්‍යයේ දැක්මට අනුව දේශීයත්වයට මුල්තැන දී ආර්ථිකය සංවර්ධනය කරන බව**
- **ජනතාවට සහන විශාල ප්‍රමාණයක් හා තරුණ තරුණියන්ට රැකියා දෙන බව**
- **රට විකිණීම නවතා කලින් විකුණා තිබූ රාජ්‍ය දේපළ යළි පවරා ගන්නා බව**
- **එක රටක් එක නීතියක් නිර්මාණය කරන බව**
- **පාස්කු ප්‍රහාරයට සම්බන්ධ මහ මොළකරුවන් ඇතුළු සියලු දෙනාට දඬුවම් දෙන බව හා වින්දිතයන්ට සාධාරණය ඉටුකරන බව**
- **විනයගරුක රටක් හදන බව**
- **ඥාතීන්ට තනතුරු දීම නවතා පවුල් පාලනයකින් තොර රටක් හදන බව**
- **වංචාව, දූෂණය, නාස්තිය නවතන බව හා මහ බැංකු බැඳුම්කර වංචනිකයින් ඇතුළු දූෂිතයන්ට දඬුවම් දෙන බව**
- **පරිසරය ආරක්ෂා කරන බව**
- **වියතුන් පෙරටු කරගත් විද්‍යාත්මක හා විශාල නොවන ඇමති මණ්ඩලයක් මගින් රට පාලනය කරන බව හා සම්ප්‍රදායික දේශපාලන සංස්කෘතිය වෙනස් කරන බවය.**

2015 බලයට පැමිණි රනිල් - මෛත්‍රී පාලනයේ අසාර්ථකත්වය හා අරාජිකත්වය විසින් නිර්මාණය කළ දේශපාලන තත්වය තම වාසියට යොදා ගනිමින් සම්ප්‍රදායික දේශපාලනඥයෙක් නොවන පුද්ගලයෙක් ලෙස අලුත් රටක් හැදීමට ඉහත පොරොන්දු ලබාදී බලයට පැමිණි ගෝඨාභය රාජපක්ෂ ඇතුළු රාජපක්ෂවරුන්ගේ පාලනය විසින් මේ වනවිට ලංකාව ඇද දමනු ලැබ ඇත්තේ ඛේදජනක ඉරණමක් වෙත නොවේද?

## විනාශයේ තරම

මේ වනවිට අපේ රටත් ජනතාවත් මුහුණ දී ඇති අර්බුදයේ තරම විශාලය. රට ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන යන හැම ක්ෂේත්‍රයක් තුළම පිරිහී ඇත. මෙතෙක් අනුගමනය කළ වැරදි ආර්ථික ප්‍රතිපත්තියත් (කොල්ලකාරී විවෘත ආර්ථිකය) වංචා, දූෂණ හා නාස්තියත් දේශපාලනයේ පාදඩකරණයත්, පවුල්වාදයත් පාලකයින්ගේ හිතුවක්කාරී, අත්තනෝමතික, උද්ධච්ච හැසිරීම හා මෝඩ තීරණත් නිසා මුළු රටම විනාශය කරා ගමන් කරමින් සිටී. ඒ තුළ,

- **ආර්ථිකය බිඳවැටී, නිෂ්පාදන මාර්ග දුර්වල වී, රට ණය උගුලක සිරවී ඉන් ගොඩ ඒමට නොහැකිව සිටී.**
- **2021 වසරට අපේ රට පා තැබුවේ රු. බිලියන 16,000ක පමණ ණය කන්දරාවක් සහිතවය. දැන් වසරක ණය පොලී වාරිකය, වසරක රාජ්‍ය ආදායමට වඩා වැඩිවී ඇත. 2020 වසරේ ණය පොලී වාරිකය රු. බිලියන 1940ක් වන විට රාජ්‍ය ආදායම රු. බිලියන 1370කි.**
- **විදේශ වත්කම් බිඳවැටීම නිසා විදේශ විනිමය හිඟයක් ඇතිවී තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ එදිනෙදා ජීවිතයට බලපාන අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වීමට පවා මුදල් නොමැතිව ලෝකය පුරා හිඟාමනේ යාමට සිදුවීමය.**
- **මේ නිසා ගෑස් පෝලිම්, තෙල් පෝලිම්, කිරිපිටි පෝලිම් ආදී ලෙස විවිධ පෝලිම්වල රස්තියාදු වීමට ජනතාවට සිදුවී තිබේ.**
- **ඉන්ධන, ගෑස්, සහල්, තිරිඟුපිටි, කිරිපිටි ආදී සියලුම අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පාලනයකින් තොරව ඉහළ යමින් තිබේ. රට පාලනය කිරීම තබා මිල පාලනය කිරීමටවත් විධායක ජනාධිපතිවරයාට නොහැකි බව දැන් ඔප්පු වී අවසන්ය. වෙළඳපොළේ භාණ්ඩවල මිල තීරණය කිරීම ආණ්ඩුවට හිතවත් ජාවාරම්කාර ව්‍යාපාරිකයින්**

කිහිප දෙනෙක් අතට පත්ව තිබේ. මින් පීඩාවට පත්ව ඇත්තේ පොදු ජනතාවය.

- රසායනික පොහොර හා කෘෂි රසායන දිගුකාලීන සැලසුමක් සහිතව නතර කරනවා වෙනුවට එකවර නතර කිරීම නිසා අද ගොවි ජනතාව මහා විපතකට පත්ව සිටී. අනාගතයේ රට තුළ ආහාර හිඟයක් ඇතිවීමේ අවදානමත්, ගැමි ආර්ථිකය විනාශ වී ගොවියා හිඟමනට වැටීමේ අනතුරත් මතුව තිබේ. රට පුරා ඇවිළෙන ගොවි විරෝධතා කියාපාන්නේ මේ අර්බුදයේ බරපතළකමය.
- එසේම රටට විදේශ වත්කම් ඉපැයූ තේ, රබර්, කුරුඳු වැනි වාණිජ භෝග වගාවන්ද මේ නිසා අනතුරට පත්ව ඇත.
- රටේ සම්පත් විකිණීම නතර කරන බවටත්, විකුණූ ඒවාද නැවත පවරාගන්නා බවටත් පවසා බලයට ආ වර්තමාන ආණ්ඩුව රටේ වටිනාම සම්පත් ඇමරිකා එක්සත් ජනපදයට, ඉන්දියාවට, චීනයට විකුණා දමමින් සිටී. කොළඹ වරායේ බටහිර ජැටිය ඉන්දියාවටත්, වරාය යාබද අක්කර 13ක් චීනයටත්, කෙරවලපිටිය විදුලි බලාගාරයේ වැඩි කොටස් ප්‍රමාණයක් හා ඒ සඳහා වන ගෑස් නල පද්ධතිය සහ ගෑස් ගබඩා පර්යන්තය ඉදිකිරීම ඇමරිකාවටත් පවරාදීම උදාහරණ තුනක් පමණි.
- ත්‍රිකුණාමලය තෙල් ටැංකි සහ ඉඩම්, කොළඹ නගරයේ ඉපැරණි ගොඩනැගිලි හා වටිනා ඉඩම් විකිණීමටද දැනටත් සැලසුම් කර ඇත. එයට ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, යෝර්ක් ගොඩනැගිල්ල, ගෆූර් ගොඩනැගිල්ල, විදේශ අමාත්‍යාංශ ගොඩනැගිල්ල, මහ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඇතුළු පෞරාණික වටිනාකමක් ඇති ගොඩනැගිලිද සහිත ඉඩම් හා ආයතන 13ක් ඇතුළත්ය. අවසානයේ අපට රටක් ඉතිරි නොවන තත්වයක් ඇතිවී තිබේ.
- නීතිය සැමට සාධාරණව ඉටුකරන බවටත් විනයගරුක රටක් හදන බවටත්, වංචා-දූෂණ නතර කරන බවටත් පවසා බලයට ආ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාලනය දැන් කරමින් සිටින්නේ කුමක්ද?

  දැන් රටේ නීතියක් නැත. වත්මන් ආණ්ඩුවට හා රාජපක්ෂ පවුලට සම්බන්ධ දූෂිතයන් රැසකට පවරා තිබූ නඩු ඉවත්කරමින් ඔවුන් නිදහස් කරමින් සිටී.

- **ඒ අතර ආණ්ඩුවට එරෙහිව මත දක්වන, උද්ඝෝෂණ කරන අය මර්දනය කිරීමද අරඹා ඇත. ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට ලක්ව තිබේ.**
- **මහජන මුදල් හොරකම්, වංචා-දූෂණ දිගටම සිදුවේ. ජනතාව පෝලිම්වල දුක් විඳිද්දී, කුසගින්නේ සිටියෙදී, ආණ්ඩුවේ ප්‍රබලයෝ දිගටම වංචා-දූෂණ මගින් මුදල් පොදි ගසති.**

  **පසුගියදා හෙළි වූ පැන්ඩෝරා පත්‍රිකාවල සඳහන්ව තිබූ පරිදි නිරූපමා රාජපක්ෂ හා ඇගේ සැමියා වන තිරු නඩේෂන් සතුව ඇති හෙළිදරව් වූ මුදල පමණක් රුපියල් කෝටි 3,500කි. මේවා රටක් ණය කරමින් වංචා කරන ලද මුදල්ය.**
- **වනාන්තර එළිකරමින්, ගස් කපමින්, පරිසරය විනාශ කිරීමද දිගටම සිදුවේ. අලි-මිනිස් ගැටුම උග්‍ර කරවමින් වන බිම් සමාගම් වෙත පවරා දෙමින් තිබේ.**
- **වියත්මගේ වියතුන්ගෙන් සැදුම් ලත් විද්‍යාත්මක ඇමති මණ්ඩලයකින් රට පාලනය කරනු ඇතැයි ජනතාව සිතා සිටියද සැබැවින්ම සිදුව ඇත්තේ කිසිදු දැනුමක් නැති බලයෙන් හිස උදුම්මා ගත් දූෂිතයන් කණ්ඩායමක් විසින්ම රට පාලනය කිරීමය. අප වෙනස් කළ යුත්තේ මෙය නොවේද?**

මෙහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ මේ රටේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්, ගොවි ජනතාව, ධීවර ජනයා, වැවිලි වගාවන්ට සම්බන්ධ අය, ස්වයං රැකියා කරන්නන්, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් හා ව්‍යාපාරිකයන්, වෘත්තීයවේදීන්, කාන්තාවන්, සිසුන් ඇතුළු සෑම ජන කොටසක්ම පීඩාවෙන් පීඩාවට පත්ව සිටීමය. මේ අර්බුදයෙන් මිදීමට අප සියලු දෙනාම සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතුය.

## වෙනස් කළ යුත්තේ කුමක්ද?

මේ අර්බුදයට විසඳුම තවත් තක්කඩි දේශපාලකයෙකුට රැවටීම හෝ කලින් රට පාලනය කොට පරාජයට පත් පක්ෂ යළි බලයට ගෙන ඒම නොවේ. එබැවින් මෙතෙක් වසර 73ක් සිදුකළ තට්ටු මාරු දේශපාලනය අවසන් කරමු. ජනතාව රැවටීමට එන තනි තනි නායකයන්ට, මැජික්කරුවන්ට මේ අර්බුදයෙන් ජනතාවත් රටත් ගලවා ගත නොහැකි බව වටහා ගනිමු.

අප ඉදිරිපිට දැන් ඇත්තේ එකම විසඳුමකි. ඒ, මෙතෙක් අනුගමනය කළ බංකොළොත් දේශපාලන මඟ වෙනස් කර නව මාවතකට පා තැබීමය; සැබෑ වෙනසක් සඳහා පෙළගැසීමය.

අර්බුදයට සැබෑ විසඳුම ඇත්තේ බලලෝභී පුද්ගල චරිත පසුපස යාම හෝ දියසෙන් කුමාරවරු එනතුරු බලා සිටීම තුළ නොව රටේ ගැඹුරු ප්‍රතිපත්තිමය වෙනස්කම් කළ හැකි සැබෑ ජනතාවාදී පාලනයක් සඳහා පෙළගැසීම තුළය. එවැනි පාලනයක ප්‍රධාන පියවර වන්නේ,

1. **රට ණය කළ, දිළිඳුභාවයට ඇද දැමූ වර්තමාන කොල්ලකාරී ආර්ථික ක්‍රමය, ණයට කන ආර්ථික ක්‍රමය වෙනස් කර නිෂ්පාදනය මත පදනම් වූ වත්කම් උපයන ආර්ථිකයක් ගොඩනැගීම, එහි ප්‍රතිලාභ සියලු ජනතාවට සාධාරණව ලැබෙන ක්‍රමයක් සහතික කිරීම,**
2. **රටේ පවතින වංචාවෙන්, දූෂණයෙන් පිරුණු, බඩ වඩාගැනීම එකම අරමුණ කරගත් වරප්‍රසාද අරමුණු කරගත් දේශපාලන සංස්කෘතිය වෙනස් කර දේශපාලනය වරප්‍රසාද නැති සැබෑ මහජන සේවයක් බවට පත්කිරීම සහ**
3. **සමාජ සාධාරණත්වය, නීතියේ සමානාත්මතාවය, ජාතික සමගිය, ප්‍රජාතන්ත්‍රවාදය සහිත මානව හිමිකම් සුරැකෙන සාමූහිකත්වයෙන් යුත් මිනිසුන් සහිත නව සමාජයක් නිර්මාණය කිරීමය.**

# අපි කුමක් කරමුද?

**පවතින අර්බුදය නිසා වේදනාවට හා කලකිරීමට පත්වී මච්බිම හැර යාම හෝ දේශපාලනය අත්හැර දැමීම අපේ වගකීම නොවේ. අප සැමගේ වගකීම වන්නේ පවතින අසමත්, ජනතා විරෝධී පාලනය වෙනස් කර සැබෑ ලෙසම සුන්දර රටක්, ලස්සන ජීවිතයක් නිර්මාණය කිරීමට දායක වීමය.**

**ඒ සඳහා ප්‍රබල මහජන බලයක් පුළුල් මහජන ව්‍යාපාරයක් ගොඩනගමු. රට හදන, රට රකින වැඩපිළිවෙළේ ඔබත් සජීවී කොටස්කරුවෙකු විය යුතුය. ඒ වෙනුවෙන් එක් වන ලෙස අපි ඔබට ආරාධනා කරමු.**

## අපි ඔබ හමුවට මෙසේ පැමිණ සිටිමු.
## අපි කතා කරමු. ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කරමු.
## අලුත් මාවතකට හැරෙමු,
## ජවිපෙ සමග, ජාතික ජන බලවේගය සමග විශ්වාසයෙන් අත්වැල් බැඳ ගනිමු. ජයග්‍රහණය දක්වා පෙරට යමු.

# ඔබට ජය! රටට ජය!!

**අප අමතන්න**

| | | |
|---|---|---|
| **කොළඹ** | **ලක්ෂ්මන් නිපුනආරච්චි** | **0773497866** |
| ගම්පහ | මහින්ද ජයසිංහ | 0718297022 |
| **කළුතර** | **නලින්ද ජයතිස්ස** | **0718100605** |
| ගාල්ල | නලින් හේවගේ | 0712669003 |
| **මාතර** | **සුනිල් හඳුන්නෙත්ති** | **0773908760** |
| හම්බන්තොට | නිහාල් ගලප්පත්ති | 0718219987 |
| **රත්නපුර** | **ශාන්ත පද්මකුමාර** | **0714431483** |
| කෑගල්ල | එච්.පී. ධම්මික | 0773436546 |
| **මහනුවර** | **ලාල්කාන්ත** | **0712473104** |
| මාතලේ | ගමගෙදර දිසානායක | 0712391957 |
| **නුවරඑළිය** | **මංජුල සුරවීර ආරච්චි** | **0717176366** |
| බදුල්ල | සමන්ත විද්‍යාරත්න | 0714479589 |
| **මොනරාගල** | **ආර්.එම්. ජයවර්ධන** | **0718758793** |
| කුරුණෑගල | නාමල් කරුණාරත්න | 0718220005 |
| **පුත්තලම** | **ගයාන් ජානක** | **0718201710** |
| අනුරාධපුර | සුසන්ත කුමාර | 0716540533 |
| **පොළොන්නරුව** | **ටී.බී. සරත්** | **0719178866** |
| ත්‍රිකුණාමලය | අරුන් හේමචන්ද්‍ර | 0773377325 |
| **අම්පාර** | **වසන්ත පියතිස්ස** | **0702170152** |
| මඩකලපුව | කන්දසාමි ප්‍රභූ | 0771266464 |
| **වව්නියාව** | **උපාලි සමරසිංහ** | **0779080255** |
| යාපනය | රාමලිංගම් චන්ද්‍රසේකර් | 0777795958 |
| **මුලතිව්** | **මරුන්ගන් මෝගන්** | **0770880580** |
| මන්නාරම | සවේරියාන් ලැම්බට් | 0778935787 |
| | සමරසිංහ බණ්ඩාර | 0779436120 |
| **කිලිනොච්චිය** | **ඉලයතම්බි කනේෂපිල්ලේ** | **0773594424** |
| | **ප්‍රැන්සිස් ජෝෂප්** | **0779290790** |

# ජනතා විමුක්ති පෙරමුණ

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි උපුල් රන්ජන් වන මා විසින් මහරගම, පිළියන්දල පාර, නුගගහ පෙදෙස 43/20, ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවන ලදී.

2021 නොවැම්බර්